## සාධාරණීකරණය

ගැටවරවියේ පසුවන දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම වර්තමානයේ දක්නට ලැබෙන ඉතාම සෝචනීය තත්වයකි. මතට ඇබ්බැහි වීමේ මනෝ සාමාජීය ලක්ෂණ පිළිබඳ ගවේෂණය කිරීම ඉතා වැදගත් පර්යේෂණ මාතෘකාවක් ලෙස හැඳින්විය හැකිය. ළමයින් මත්ද්‍රව්‍ය වලට යොමුවීම වළක්වා ගැනීමට ගත හැකි පියවර යෝජනා කිරීම, ළමුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම කෙරෙහි බලපාන පවුල් පසුබිම් සාධක වන අධ්‍යාපනය බිඳුණු පවුල, ක්‍රියාව, කුලවද්දා ගැනීම, වයස, කායික මානසික දුබලතාවය, ආර්ථික බලපෑම, ආදි සාධක පිළිබඳ විධිමත් ලෙස හඳුනාගනිමින් එම සාධක නිසා සිදුවන අහිතකර බලපෑම අවම කිරීම සඳහා ගතහැකි පියවර යෝජනා කරනු ලැබේ..

## අධ්‍යයනයේ සීමා

පර්යේෂණයක් සිදු කිරීමේ දී යම් යම් සීමාවීම්වලට නතුවීමට පර්යේෂකයාට සිදු වේ. මෙම පර්යේෂණය තළ දී යම් සීමාවන් කිහිපයකට යටත්ව පර්යේෂණය සිදු කරන ලදි. පර්යේෂණයක් සඳහා නියඳියක් තෝරාගැනීමේ දී නියැඳියේ විශාලත්වය මත නිරවද්‍යතාවය ආරක්‍ෂා වේ. එහදි මාම්පිටිය පුනරුත්ථාපන කඳවුරේ සිසුන් දස දෙනෙකු සහ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකු පමණක් අධ්‍යයනය සඳහා යොදාගන්නා ලදි.

## සාහිත්‍ය විමර්ශනය

ළමයින් මත්ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහි වීම කෙරෙහි බලපාන සාධක අතුරින් පවුල් පසුබිම සාධක පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී මේ ආශ්‍රිතව සිදු කරන ලද විවිධ අධ්‍යයනයන් කෙරෙහි අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ. එයට හේතුව මේ පර්යේෂණයේ වලංගුතාවය තහවුරු කිරීම සඳහා ය. දයා රෝහණ හා හේළි නිමලා අතුකෝරාළ විසින් රචනා කර ඇති "ළමා මනෝවිද්‍යාව හා ළමා සංවර්ධනය" යන කෘතිය වැදගත්වේ. එහිදී

